# නවීකරණිත අනුරාධපුර ජන කෞතුකාගාර උරුමය ප්‍රවර්ධනය කිරීම සඳහා ගතහැකි ක්‍රියාමාර්ග පිළිබඳ සමාජ පුරාවිද්‍යාත්මක විමර්ශනයක්

එල්.ඒ.එස්. උෂානි[1]

මුඛ්‍ය පද: අනුරාධපුර, ජන කෞතුකාගාරය, යෝජනා, ප්‍රචාරණය, උපායමාර්ග

## හැඳින්වීම

නූතන සමාජයට සේවය කරන ප්‍රධාන පෙළේ ආයතන අතුරෙන් කෞතුකාගාර වැදගත් කොටසකි. සංස්කෘතික, කලාත්මක, විද්‍යාත්මක, ශිල්පීය දැනුම වර්ධනයට හා ව්‍යාප්ත කිරීම සඳහා මේ ආයතනය ගන්නා පරිශ්‍රය වැදගත්කම අද සමස්ත සමාජයේම පිළිගෙන ඇත. 1877 දී ශ්‍රී ලංකාවේ ප්‍රථම කෞතුකාගාරය වශයෙන් කොළඹ ජාතික කෞතුකාගාරය ආරම්භ විය. ඉන් අනතුරුව ශ්‍රී ලංකාව පුරා විවිධ තේමා ඔස්සේ කෞතුකාගාර නිර්මාණය විය. ශ්‍රී ලංකාවේ ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව විසින් පාලනය වන අනුරාධපුර ජන කෞතුකාගාරය 1971 අගෝස්තු 22 වන ආරම්භ කරන ලදී. මෙම කෞතුකාගාරය තුළ තැන්පත් කොට ඇත්තේ නුවර කලාවේ ජන ජීවිතයේ පිළිබිඹු කරන පුරා කෘති එකතුවකි. පුරාවිද්‍යාත්මක, සංස්කෘතික උරුමය, ස්පර්ශීය හා අස්පර්ශීය උරුමය සම්බන්ධ වටිනාකම් ඇති ස්ථානයකි. අනුරාධපුර ජන කෞතුකාගාරයෙහි ඇති සංස්කෘතික උරුමය සමාජගත කිරීම උදෙසා කළ යුත්තේ කුමක්ද? මෙහි පර්යේෂණ ගැටලුව වේ. මෙම පර්යේෂණයේ මූලික වශයෙන් සිදුකිරීමට බලාපොරොත්තු වන්නේ, වසර කිහිපයක සිට අලුත්වැඩියා කටයුතු හේතුවෙන් වසා දමා ඇති අනුරාධපුර ජන කෞතුකාගාරය, අලුත්වැඩියා කටයුතු නිමාවීමෙන් පසු, නැවත සමාජයට එකතු කිරීම සඳහා කාර්යක්ෂම යෝජනා ක්‍රමයක් සකස් කිරීමය.

## ක්‍රමවේදය

අනුරාධපුර ජන කෞතුකාගාරයෙහි සංස්කෘතික උරුමය ප්‍රවර්ධනය කිරීම සඳහා සමාජ පුරාවිද්‍යාත්මක විමර්ශනයක් යන පර්යේෂණ මාතෘකාව යටතේ දත්ත අත්පත් කර ගැනීම, දත්ත විශ්ලේෂණය, දත්ත ඉදිරිපත් කිරීම උදෙසා මෙම පර්යේෂණ ක්‍රමවේද භාවිත කරනු ලබයි. පුස්තකාල සමීක්ෂණ ක්‍රමවේදය හා ක්ෂේත්‍ර අධ්‍යයන උපයෝගී කරගත් අතර, පුස්තකාල සමීක්ෂණ ක්‍රමවේදය යටතේ ද්විතීක මූලාශ්‍ර පරිශීලනයෙන් දත්ත ලබා ගන්නා ලදී. ක්ෂේත්‍ර අධ්‍යයනය සිදුකරන ලද්දේ අනුරාධපුර ජන කෞතුකාගාරය ඇසුරෙනි. එහිදී අහඹු නියදි ක්‍රමය යටතේ දත්ත ලබා ගැනීම සිදුකරන ලැබූ අතර එහිදී ගැඹුරු සම්මුඛ සාකච්ඡා ක්‍රමයට දත්ත

[1] පුරාවිද්‍යා හා උරුම කළමනාකරණ අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය
ssh2020476@ssh.com

ලබා ගැනීම සිදුකර ඇත. එම ලබාගත් දත්ත අදාළ කාණ්ඩවලට වෙන්කර තේමා ගතකරණය යටතේ දත්ත විශ්ලේෂණය හා ඉදිරිපත් කිරීම සිදුකර තිබේ. ඉන්පසුව එම දත්ත ඔස්සේ අවසාන වශයෙන් කාර්යක්ෂම යෝජනා ක්‍රමයක් සකස් කිරීම සිදුකරනු ලැබීය.

## ප්‍රතිඵල හා සාකච්ඡාව

ශ්‍රී ලංකාවේ ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව විසින් පාලනය වන අනුරාධපුර ජන කෞතුකාගාරය තැන්පත් කොට ඇත්තේ නුවර කලාවියේ ජන ජීවිතය පිළිඹිඹු කරන පුරා කෘති එකතුවකි. වස්තූන් ප්‍රදර්ශනය කිරීමට සහ ක්‍රමයෙන් නවීන විලාසිතාවට සංක්‍රමණය වන ග්‍රාමීය ගොවි ජනතාවගේ ජීවන රටාව පිළිබිඹු කිරීමට සේවය කරයි. ජන කෞතුකාගාරයේ වගා මෙවලම්, මුළුතැන්ගෙයි උපකරණ, වෛද්‍ය උපකරණ, සංගීත භාණ්ඩ ආදී විවිධ සාම්ප්‍රදායික වස්තූන් ඇත. සාමාන්‍ය ජනතාවගේ එදිනෙදා ජීවිතය, සම්ප්‍රදායන්, ශිල්ප සහ සිරිත් විරිත් සංරක්ෂණය කිරීම සහ ප්‍රදර්ශනය කිරීම කෙරෙහි අවධානය යොමු කරන සංස්කෘතික ආයතනයක් වේ. ලංකාවේ මෙම වර්ගයේ ඇති එකම කෞතුකාගාරය ද මෙය වේ. මෙම කෞතුකාගාරය උතුරු මැද පළාතේ අනුරාධපුර දිස්ත්‍රික්කයේ අනුරාධපුර ශුද්ධ භූමියට අයත් ප්‍රදේශයේ අභය වැවට දකුණින් පිහිටා තිබේ. මෙම කෞතුකාගාර ගොඩනැගිල්ල තට්ටු දෙකකින් සමන්විත වේ. ඉංග්‍රීසි පාලන සමයේ ඉදිකරන ලද්දකි. එකල මෙය සහකාර ඒජන්ත බංගලාව ලෙස හඳුන්වා තිබේ. පසුව පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ භාණ්ඩ ගබඩාවක් ලෙස භාවිතා කර, පසුව කෞතුකාගාර දෙපාර්තමේන්තුවට පවරා ගෙන කෞතුකාගාරය සඳහා සැළසුම් කර ඇත.

වර්තමානය වන විට ජන කෞතුකාගාරය අලුත් වැඩියා කටයුතු හේතුවෙන් තාවකාලිකව වසා ඇත.මෙම පර්යේෂණයේ මූලික වශයෙන් සිදුකිරීමට බලාපොරොත්තු වන්නේ, වසර කිහිපයක සිට අලුත්වැඩියා කටයුතු හේතුවෙන් වසා දමා ඇති අනුරාධපුර ජන කෞතුකාගාරය, අලුත්වැඩියා කටයුතු නිමාවීමෙන් පසු, නැවත සමාජයට එකතු කිරීම සඳහා කාර්යක්ෂම යෝජනා ක්‍රමයක් සකස් කිරීමය. කෞතුකාගාරයක අරමුණ කාරයක්ෂමව ඉටුකර ගනිමින් නරඹන්නන්ට වටිනාකමක් ලබාදීම සඳහා වටිනාකම් නිර්මාණය කිරීම කෞතුකාගාර ප්‍රචාරණය වශයෙන් හැඳින්විය හැකිය. ඒ අනුව අනුරාධපුර ජන කෞතුකාගාරය සමාජගත කිරීම සඳහා ප්‍රථමයෙන්ම සිදුකළ යුතු වන්නේ ප්‍රචාරණ සැලැස්මක් නිර්මාණය කිරීමය. ප්‍රචාරණ සැලැස්මක් නිර්මාණය කිරීමේ දී අවධානය යොමු කළයුතු ප්‍රධාන කරුණු කිහිපයක් ඇත. එනම්, කෞතුකාගාර කාර්යයමණ්ඩලය, කෞතුකාගාර භාණ්ඩ එකතුව, කෞතුකාගාර මෙහෙවර ප්‍රකාශය, අරමුණු හා පරමාර්ථ, පිවිසීමේ හැකියාව හා අවකාශය, ප්‍රදර්ශනය, කෞතුකාගාරය විසින් ක්‍රියාත්මක කරන වැඩසටහන්, අධ්‍යාපනය, නරඹන්නන්ට සපයා ඇති පහසුකම්, ඇස්තමේන්තු වැනි කරුණු පිළිබඳවය. කෞතුකාගාර ප්‍රචාරණ සැලැස්මක් නිර්මාණය කිරීමේදී ප්‍රධාන කරුණු පහක් හඳුනාගත හැක.

- කෞතුකාගාරය පවතින තත්ත්වය පිළිබඳව අවධානය යොමු කිරීම.
- වැඩසටහන් සංවර්ධනය හා උපායමාර්ග කෙරෙහි අවධානය යොමු කිරීම.
- වෙළඳ පොළ අරමුණු සැලසුම් කිරීම.
- වෙළඳපොළ අවස්ථා හඳුනා ගැනීම.
- ක්‍රියාත්මක කිරීම හා වාර්තාගත කිරීම.

කෞතුකාගාර ප්‍රචාරණ සැලැස්මක් සිදුකිරීම සඳහා විවිධ උපායමාර්ග වර්තමානය වන විට ගෝලීය වශයෙන් කෞතුකාගාර හඳුනාගෙන ක්‍රියාත්මක කරන බව ගෝලීය කෞතුකාගාර අධ්‍යයනය කිරීමෙන් භාවිත කළ හැකිය. එනම් අන්තර්ජාල, වෙබ් අඩවි, විවිධ මෘදුකාංග, සමාජ ජාලා, වර්තමානයේ භාවිත කරන නව තාක්ෂණය, පොස්ටර්, ඇස්තමේන්තු, දැන්වීම්, අත්පත්‍රිකා, සඟරා, ප්‍රදර්ශන, ඩිජිටල් පුවරු, නාම පුවරු, ක්‍රියාකාරකම්, රූපවාහිනි, දේශනා, සංචාරක කර්මාන්තය සම්බන්ධ ආයතන පදනම් කර ගැනීම වැනි උපායමාර්ග අනුරාධපුර ජන කෞතුකාගාරය වෙත යොදාගෙන ඒ හරහා මහජනතාව අතරට අනුරාධපුර ජන කෞතුකාගාරය ගෙන යා හැකිය.

**සමාලෝචනය**

අනුරාධපුර ජන කෞතුකාගාරය පුරාණ නගරයේ සාම්ප්‍රදායික ජීවන රටාව, මෙවලම් සහ අත්කම් සංරක්ෂණය කර ප්‍රදර්ශනය කරයි. පර්යේෂණයේ මූලික වශයෙන් සිදුකිරීමට බලාපොරොත්තු වන්නේ, වසර කිහිපයක සිට අලුත්වැඩියා කටයුතු හේතුවෙන් වසා දමා ඇති අනුරාධපුර ජන කෞතුකාගාරය, අලුත්වැඩියා කටයුතු නිමාවීමෙන් පසු, නැවත සමාජයට එකතු කිරීම සඳහා කාර්යක්ෂම යෝජනා ක්‍රමයක් සකස් කිරීමය. ප්‍රතිසංස්කරණයෙන් පසු, මහජනතාව සමඟ නැවත සම්බන්ධ වීමට අන්තර්ජාල, වෙබ් අඩවි, විවිධ මෘදුකාංග, සමාජ ජාලා, වර්තමානයේ භාවිත කරන නව තාක්ෂණය, පොස්ටර්, ඇස්තමේන්තු, දැන්වීම්, අත්පත්‍රිකා, සඟරා, ප්‍රදර්ශන, ඩිජිටල් පුවරු, නාම පුවරු, ක්‍රියාකාරකම්, රූපවාහිනි, දේශනා, සංචාරක කර්මාන්තය සම්බන්ධ ආයතන පදනම් කර ගනිමින් ප්‍රවර්ධන කටයුතු සිදු කරගත හැකිය. එමගින් නරඹන්නන්ගේ සේවා සහ අධ්‍යාපනික ක්‍රියාකාරකම් වැඩිදියුණු කිරීම, අත්දැකීම් වැඩි දියුණු කළ හැකි අතර, දේශීයව සකස් කරන ලද ගෝලීය ප්‍රවර්ධන පිළිවෙත් අනුගමනය කිරීමෙන් කෞතුකාගාරය ප්‍රවේශ විය හැකි සංස්කෘතික මධ්‍යස්ථානයක් බවට පත් කළ හැකි අතර උරුම දැනුවත්භාවය ශක්තිමත් කළ හැකිය.

**ආශ්‍රිත මූලාශ්‍රය**

දිසානායක, ආර්. (2006). ***ශ්‍රී ලංකාවේ කෞතුකාගාරය ඉතිහාසය.*** කර්තෘ ප්‍රකාශනයකි.

දිසානායක. ආර්. (1999). ***ශ්‍රී ලංකාවේ කෞතුකාගාරය සන්නිවේදනය.*** කොළඹ 10: ඇස්. ගොඩගේ සහ සහෝදරියෝ.

ජයවර්ධන, සරත් චන්ද්‍ර. (2018). ***ඉතිහාසය ඉගෙනීමට සහ ඉගැන්වීමට කෞතුකාගාර උපයෝගී කරණය.*** සරසවි ප්‍රකාශයකි.

දිසානායක, ජී. ආර්. (1999). ***ශ්‍රී ලංකාවේ කෞතුකාගාර හා සන්නිවේදනය,*** ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.